**කුච්චවෙලි ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පින්ඩන වාර්තාව 2020ඔක්තෝබර් 05 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර්15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 අහිතකර මතය

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් කුච්චවෙලි ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 අහිතකර විගණන මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අයකළ මුද්දර ගාස්තු, ප්‍රවාරණ ගාස්තු සහ අනෙකුත් ආකෘති විකුණුම් ආදායම් රු.4,922,681කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්විය යුතුවේ. | ගැලපීම් කිරීමට පියවර ගනිමින් සිටී. |
| (ii) | ප්‍රජා සංවිධානයක හිඟහිටි අත්තිකාරම් රු.163,569ක් 2018 වර්ෂයේ නිරවුල් කර තිබුනද, එම වටිනාකම ගිණුම්වල අඩුකර දක්වා නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්වීමට පියවර ගත යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ පාලම්, මාර්ග ඉදිකිරීම සඳහා රු.10,016,576ක් වැයකළ නමුත් ගිණුම්වල රු.19,333,741කට අදාල කාර්යය ඉටු කළ බවට දැක්වීම නිසා වියදම් රු.9,317,741කින් වැඩියෙන් දක්වා තිබුණි. | වැය කළ මුදල ගිණුම්වල ඉදිරිපත් කිරිමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.8,255,431ක වීපී විදුලි පහන් මූලධන වියදම් ලෙස දැක්වීම නිසා ස්ථාවර වත්කම්වල වටිනාකම් වැඩියෙන් දක්වා තිබුණි. | වීපී විදුලි පහන් පාරිභෝජන ද්‍රව්‍ය ලෙස පවතින හෙයින් ස්ථාවර වත්කම් දැක්වීම අනවශ්‍ය වේ. | වීපී විදුලි පහන් වර්ෂයකට අධික කාලයක් භාවිතා කරනු ලබන බැවින් Warranty ලබාගත් නිසාත් මූලධන වත්කම් ලෙස ගිණුම්ගත කර ඇත. |
| (v) | සභාව විසින් ඉදිරිපත් කරන ලද 2019 දෙසැම්බර් මාසය සඳහා වූ බැංකු සැසඳුම් ප්‍රකාශයේ බැංකු ගිණුමේ රු.1,322,506ක මුදල් අඩුවීමක් නිරීක්ෂණය වූ අතර එය අතිරේඛව බැංකුවේ තැන්පත් කළ බව සඳහන් කරමින් මුදල් පොතේ ශේෂයෙන් එම ප්‍රමාණය අඩුකර බැංකු සැසඳුම් ප්‍රකාශය සකස්කර තිබුණි. | මේ පිළිබඳව විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර බැංකු ගිණුමේ මුදල් අඩුවීමට හේතු සහ ඊට අදාල වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අදාල මුදල් බැංකු ගිණුමට ලබාගැනීමට සහ අදාල වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. | බැංකු සැසඳුම් ප්‍රකාශයේ 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා බැංකුවේ අතිරේකව තැන්පත් කළ බව සඳහන් කරමින් පැවැතුණි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

(i) **ලැබිය යුතු ගිණුම්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ---------------- | ------------------------ |
| විවිධ වූ දේපළහිමියන් සහ පුද්ගලයින්ගෙන් ලැබිය යුතු වර්ග 07ක ආදායම් රු.3,275,058ක් මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටි ලෙස වර්ෂ 10කට අධික කාලයක සිට පොත්පත්, ලේඛන සහ තහවුරු කළ හැකි සාක්ෂි කිසිවක් නොමැතිව ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවැති අතර හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බැවින් කපාහැර නොතිබුණි. |

(ii) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------------ |
| (i) | වර්ග 04ක ලැබුණු, ආපසු ගෙවිය යුතු තැන්පතුවල කාල විශ්ලේෂණය පදනම් කරමින් වර්ෂ 02කට අධික කාලයක් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දීර්ඝකාලීන තැන්පතු සම්බන්ධයෙන් අදාල අයගෙන පිළිතුරක් නොලද |

| | | | |
|---|---|---|---|
| | ගතවූ රු.22,131,840ක් පැවැති නමුත් ඒවා සම්බන්ධයෙන් ආපසු ගෙවීමට හෝ අදාල ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ආදායමට මාරුකිරීමට කටයුතු කර නොතිබුණි. | | හේතුවෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | සභාව විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල වියදම් ණයහිමි ශේෂය තුළ 2015 වර්ෂයට පෙර වර්ෂවලට අදාලව පැවැති රු.693,571ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවේ තීරණය සහිතව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | වියදම් ණයහිමි ශේෂයේ නිවැරදිභාවය පරිශීලනය කළ නොහැකි නිසා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| ගිණුම් විෂයය | නිර්දේශය | අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.321,115,645 ක් වූ ගිණුම් විෂයයන් 7ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අයිතමයේ සඳහන් සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශ පරිපාලන චක්‍රලේඛයේ 02(iv) ඡේදය | නිවාඩු දින දීමනා සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් තහවුරු කළ යුතු බවට සඳහන් කර තිබුණත්, සභාවේ ලේකම්වරයා සහ සේවකයින් පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් නිවාඩු දිනවල සම්පූර්ණ නොකළ (සටහන් නොකළ) අවස්ථාවේදි සභාව විසින් නිවාඩු දින දීමනා සහ අතිරේක වේලාවන් සඳහා එකතුව රු.86,633ක ගෙවීම් සිදුකර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන සංවර්ධන ආධාර වැඩසටහන සඳහා ග්‍රාමීය සංවර්ධන සැලැස්ම, පළාත් පාලන මණ්ඩල සඳහා මහජන සහභාගීත්වයෙන් සංවර්ධන සැලැසුම් ආදිය සෙනසුරාදා සහ ඉරිදා දිනවල කොට්ඨාශයේ සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,871,627 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 30,807,863ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම්හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 17,287 | 19,509 | 9,719 | 9,790 | 10,603 | 18,867 | 11,669 | 7,198 |
| කුලී | 20,057 | 11,833 | 2,995 | 8,838 | 6,358 | 8,596 | 4,480 | 4,116 |
| අනෙකුත් ආදායම් | 30,145 | 31,061 | 30,145 | 916 | 5,163 | 5,622 | 5,164 | 458 |
| එකතුව | 67,486 | 62,403 | 42,859 | 19,544 | 22,124 | 33,085 | 21,313 | 11,772 |

#### 2.2.2 වරිපනම් හා බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුච්චවේලි උපකාර්යාලය යටතේ පවතින නිෂ්චල දේපළ ගණනය කර වරිපනම්බදු අයකිරිමේ කටයුතු සිදු කර නොතිබුණි. | වරිපනම් බදු අයකිරිමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සභාව විසින් තීරණය කර එය අයකිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | නිලාවේලි උප කාර්යාලයේ වරිපනම් බදු වර්ෂ 30කට පෙර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණි. නමුත් අවම වශයෙන් වර්ෂ 05කට වතාවක් වරිපනම් බදු නැවත තක්සේරුවක් සිදුකර බදු අයකිරිම් සහ වාර්ෂික වටිනාකමින් දේපළ සඳහා බදු | නැවත තක්සේරුවක් සිදුකර බදු අයකිරිමට කටයුතු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දි ඒවා නැවත තක්සේරු කිරීමට කටයුතු කිරිමට අදහස් කර ඇත. |

ප්‍රතිශතයන් වෙනස් නොකිරීම නිසා උපරිම වරිපනම් බදු මුදලක් අයකළ නොහැකිව පැවතුණි.

### 2.2.3 කඩකුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මස් කඩ 08ක් සඳහා රු.1,397,365ක හිඟහිටි මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟකුලී අයකිරිමට කටයුතු කර දැනට පවතින හිඟහිටි මුදල රු.871,399ක් වන බව දන්වමි. |

### 2.2.4 අනෙකුත් ආදායම්

#### 2.2.4.1 සංචාරක නිකේතන ආදායම් මත බදු ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව, සංචාරක නිකේතනවල ආදායමින් 1%කට නොඉක්මවූ බද්දක් අයකළ යුතු වුවත්, විගණන නියැදි පරීක්ෂාවේදි 2018 සහ 2019 වර්ෂ අවසාන කාලපරිච්ඡේදයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෝටල් මත බදු ගාස්තු අයකර නොතිබුණි. | සභා බල ප්‍රදේශයේ සංචාරක නිකේතන ආයතනවලින් බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | සංචාරක නිකේතන සම්බන්ධයෙන් 2019 වර්ෂයේ ඇතැම් නිකේතනවලින් ආදායම් අයකෙරෙමින් පවතී. |

#### 2.2.4.2 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ 15කටත් අධික සංඛ්‍යාවක සන්නිවේදන සම්බන්ධතා කුළුණු ස්ථාපිත කර තිබුණත් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව මෙම කුළුණු ස්ථාපිත කිරීමට අදාලව සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමේ සංවර්ධන බලපත්‍ර නිකුත් කිරිම, පූර්ව සැලැසුම් සඳහා අනුමැතිය ලබාදීම්, ක්‍රියාත්මක කිරීමේ සහතික නිකුත් කිරීම් සහ අධීක්ෂණ අනුමැතින් ආදිය ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කර නොතිබුණි. | සන්නිවේදන සම්බන්ධතා කුළුණුවල ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂකරුන් මාර්ගයෙන් මෙම තොරතුරු රැස්කිරීමට කටයුතු කර ඇත. |

2.2.4.3 බැංකු පොලී

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල අයකළ යුතු බැංකු පොලී ලෙස රු.458,318ක් දක්වමින් පැවැති නමුත් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පොලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | බැංකු පොලී සම්බන්ධයෙන් බැංකුව සමග සම්බන්ධ වී කටයුතු කරනු ලැබේ. |

**2.2.5 මුද්දර ගාස්තු**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.35,482,126ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුත වේ. | මුද්දර ගාස්තු නැගෙනහිර පළාත් සභාව විසින් අයකර යවනු ලැබේ. |

**2.2.6 උසාවි දඩ මුදල්**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ජූනි මාසයේ සිට 2019 දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයට අදාල උසාවි දඩ රු.3,838,647ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟහිටි මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය වේ. | උසාවි දඩ මුදල් ලිපි යවනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 14 දිනැති අංක01/2014 රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, අතුරු ව්‍යවස්ථා සකස් කර එය පදනම් කර ගනිමින් සභාව විසින් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එසේ වුවත්, එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතුවේ | අයවැය පදනම් කරමින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණයයටතේ, රැස්කරනු ලබනඅපද්‍රව්‍ය දිරන හා නොදිරන වශයෙන් වෙන් කර නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට ලක්කර හා දිරන අපද්‍රව්‍ය කාබනික පොහොර පිළියෙල කිරීම සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පොහොර නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතු වීම. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය එක් වැඩසටහනක් ලෙස සලකා නොතිබුණි. ඉදිරියේදි වෙනමම වැඩසටහනක්ලෙසට ගනු ලැබේ. දැනට මහජන සෞඛ්‍ය සේවා වැඩසටහනෙහි අන්තර්ගත කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රජා මධ්‍යස්ථාන සමග ගිවිසුම් 16කට එළැඹ රු.200,000 සිට රු.700,000 ක් දක්වා පරාසයකින් අත්තිකාරම් ලබාදී අදාල කාර්යයන් 08ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | කාර්යයන් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය. | කාර්යයන් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අරමුදලින් රියැදුරන් 05දෙනෙකු, පුස්තකාල සහකාරවරුන් 03දෙනෙකු සහ වැඩ හා සෞඛ්‍ය කම්කරුවන් 61දෙනෙකු අනියම් හා වැඩබැලීමේ පදනමින් ගෙවීම් සිදු කිරිම සඳහා පත්කර ආසන්න වශයෙන් මාසයකට රු. ලක්ෂ 19ක් වැය කරනු ලැබේ. එනමුත්, කුමන ආකාරයේ කාර්යයන් කරන්නේද, ඔවුන් වෙනුවෙන් දෛනික රාජකාරි කවුරුන් විසින් පවරනු ලබන්නේද, ඔවුන් විසින් ඉටු කරනු ලබන රාජකාරි කවුරුන් විසින් සහතික කරනු ලබන්නේද? යනාදි තොරතුරු සම්පූර්ණයෙන්ම විගණනයට ලබාගත නොහැකිවී තිබුණි. | අදාල කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ගත යුතුවේ. | දෛනික රාජකාරි සියල්ල තාක්ෂණික නිලධාරීන් විසිනුත්, මහජන සෞඛ්‍ය සේවා පරීක්ෂකවරුන් විසිනුත් ලබා දෙනු ලැබේ. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවය කළ සේවකයින් 11දෙනෙකු මිය යාම, ඉවත්ව යාම සහසේවය අවසන් කිරිම වැනි හේතු නිසා ඇති වූ හිඟ ණය රු.264,403 ක් සම්බන්ධයෙන් ඒවා ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකිරීමට හෝ කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය අයකර ගැනිමට කටයුතු කළ යුතු වේ. | හිඟ ණය අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ) දේපළ බදුදීමේදි සිදුවන අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ගිවිසුමකට නොඑළැඹ කඩකාමර 10ක් බදු දී තිබුණි. | ගිවිසුම් අත්සන් කර ලබාදීමට කටයුතු කළ යුතුවේ. | කඩකාමර බදු දීමට දැන්වීම් ඉදිරිපත් කළත් කවුරුන් හෝ ඉදිරිපත් නොවීම හේතුවෙන් කුලියට දී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | හිඟබදු බදුකුලී කරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් නියමිත ආකාරයට අයකිරිමට කටයුතු කළ යුතුවේ. | හිඟ බදු කරුවන් ගෙන් මූල්‍ය වර්ෂයේදී බදු අයකිරීමට කටයුතු කර ඇත. |

**(ආ) ඉඩම් විකුණුම් බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන නියැදි පරීක්ෂාවේදි 2018 සහ 2019 වර්ෂ සඳහා ඉඩම් විකුණුම් බදු අයකර නොතිබුණි. | විකුණුම් බදු ලබා ගැනීමට පියවර ගත යුතුවේ. | ඉඩම් විකුණුම් බද්දක්‍රියාත්මක නොවීම නිසා මෙම මූල්‍ය වර්ෂයේ සිට අයකිරිමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2020 ජුලි 14 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයනියමිත දිනට සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය Covid – 19 රෝගය නිසා කාල ප්‍රමාදයක් සිදු වී ඇත. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කළ කරුණු සහ නිරීක්ෂණයන් පිළිබඳව වර්ෂ 05කට අධික කාලයක සිට කටයුතු කර නොතිබුණි. | සුදුසු පියවර ගත යුතුවේ. | සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරමින් පවති. |
| (ඇ) | 2018 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කළ අවස්ථාවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් නොකළ අයිතමයන් 639ක් සහ පොත්වල සටහන් නොකළ අතිරික්තව පැවැති අයිතමයන් 76ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | සුදුසු පියවර ගත යුතුවේ. | තොග සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරමින් පවති. |

**3.6 අරපිරිමැසුම්දායි නොවන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**පරිගනක, මුද්‍රණ යන්ත්‍ර, ශ්‍රව්‍ය, දෘශ්‍ය උපකරණ මිලදී ගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නැගෙනහිර පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2017/PT/02/02 ප්‍රකාරව ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුවකට (DIPE) රු.500,000කට අඩු වටිනාකමක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කළ හැකි වුවත්, රු.මිලියන 4.5ක ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | භාණ්ඩ අවශ්‍යතාවයට අනුව පියවරෙන් පියවර මිලදි ගෙන ඇත. |
| (ii) | හදිසි අවශ්‍යතාවක් ලෙස මිලදි ගත් බවට සඳහන් කර තිබුණත් පරිගනක දෙකක් ඇතුළු ඇතැම් භාණ්ඩ හැර ඉතිරි භාභාණ්ඩ හා උපකරණ වර්ෂයකට අධික කාලයක් භාවිතා කර නොතිබුණි. | සභාවේ අරමුදල් නියමිත ආකාරයෙන් උපයෝජනය කර ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුල්මුඩේ මහජන පුස්තකාලයේ, පුස්තකාලයේ සේවාවන් ඉහළ නැංවීමේ අදහසින් E-තත්ත්ව පුස්තකාලයට මිලදි ගැනිම් සිදුකර ඒවා නියමිත ආකාරයෙන් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | පරිගනක ඇතුළු තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදි සභාවේ මිලදි ගැනුම් ඇණවුම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ICT නිලධාරි විසින් තම අත්සන යොදා එක්තරා ආකාරයක නිල අනුමැතියක් පමණක් ලබාදුන් බව දක්නට ලැබුණි. | පරිගනක ආශ්‍රිත භාණ්ඩ මිලදී ගැනීමට ප්‍රථම උචිත ආකාරයේ තාක්ෂණික උපදෙස් ලබාගැනිමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි ඔබගේ උපදෙස් අනුව කටයුතු කළ හැකිය. |
| (iv) | ප්‍රාදේශීය සභාවේ සේවකයින් STC සේවකයින්ගේ සහාය ඇතිව සාධාරණ මිලට වැඩියෙන් මිලදී ගැනීම හේතුවෙන් භාණ්ඩ හා සේවා 232ක් ප්‍රසම්පාදනයේ දී සභාවට රු.2,366,772ක පාඩුවක් සිදු වී තිබුණි. | සිදු වූ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අපගේ සභාව විසින් පනතට අනුකූලව STC ආයතනයෙන් මිලදී ගැනීම සඳහා මිලදී ගැනීමේ ඇනවුම් STC ආයතනයට පමණක් ලබා දී ඇති අතර වෙනත් කිසිඳු බෙදාහරින්නෙකු වෙත මිලදී ගැනීමේ ඇනවුම් නිකුත් කර නොතිබුණි. STC ආයතනයට පමණක් ගෙවීම් සිදු කර තිබුණි. |

**4. ප්‍රසම්පාදනය**

**4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැපයුම් හා සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට පියවර ගත යුතුවේ. | මේ පිළිබඳ තොරතුරු ලබාගෙන ඉදිරියේදි සකස් කිරිමට පියවර ගෙන ඇත. |

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක වි නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | කාර්ය මණ්ඩල හිඟය මේ සඳහා හේතුව වි තිබේ. |

**5.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කමිටු රැස්විම් පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ අදාල කමිටු පත්කර කමිටු රැස්වීම් පැවැත්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |